බොහෝ විට අපගේ කටවහරේ භාවිතා වන යම් යම් යෙදුම්, ඇතැම් විටකදී සෘණාත්මක සන්දර්භයන් තුළ භාවිතා කිරීම ඔස්සේ යම් පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම්, ජාතීන් හෝ ප්‍රජාවන් සම්බන්ධයෙන් නිෂේධනාත්මක ඒකාකෘතික කිරීම් ජනිත කෙරෙන්නේ දැයි සොයා බැලීම වටී.
නිදසුනක් ලෙසින් "චීනා" යන යෙදුම ගනිමු. "කොළඹ වරායට අනවසරයෙන් රිංගූ චීනා ඇතුළු 5 ක් දැලේ" යනුවෙන් සහ ඊට සමාන ලෙසින් සිරස්තල යෙදී තිබූ පුවත් වාර්තාවන් තුනකි. මෙම පුවත් වාර්තාවන් තුනම එක් සිදුවීමක් වාර්තා කර තිබිණි. සිරස්තලයන් තුළ "චීනා" යනුවෙන් සඳහන් වූවද, අන්තර්ගතය තුළ සඳහන් වූයේ "චීනා ජාතිකයා" ලෙසිනි. මෙවැනි අවස්ථාවන්හිදී අදාළ මාධ්‍යවේදියා විසින් නොව අදාළ පුවත් කතුවරයා විසින් එම සිරස්තල යෙදුවා විය හැක. එසේම සිරස්තලයට වැඩි ආකර්ෂණයක් ලබාදීම සඳහා හෝ සිරස්තලය තුළ අඩු වචන ප්‍රමාණයක් පවත්වා ගැනීමට චීනා වැනි යෙදුම් යොදාගත්තා වීමටද හැක.
කෙසේ නමුත්, සෘණාත්මක සන්දර්භයන් තුළ "චීනා" වැනි යෙදුම් භාවිතා කිරීම ඔස්සේ චීන ජාතිකයන් සම්බන්ධයෙන් නිෂේධනාත්මක ඒකාකෘතික කිරීම් ඇතිවනු ඇතැයි ඔබ සිතන්නේද? ඒ ඔස්සේ ඇතැම් විට විදේශික භීතිකාවක් (xenophobia) පවා ඇතිවිය නොහැකිද? ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima #Lankadeepa